# ධම්මපදය

## පුප්ඵ වර්ගය (06 ගාථාව)

**6. ගාථාව**

**"යථාපි භමරෝ පුප්ඵං - වණ්ණගන්ධං අහේඨයං**
**පලේති රසමාදාය - එවං ගාමේ මුනී චරේ"ති.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **යථාපි** | - | යම් සේ |
| **භමරො** | - | බමරා, මී මැස්සා |
| **පුප්ඵං** | - | මල ද |
| **වණ්ණගන්ධං** | - | පැහැය ද සුවඳ ද |
| **අහේඨයං** | - | නො නසමින් |
| **රසං** | - | මල්පැණි |
| **ආදාය** | - | ගෙන |
| **පලෙති** | - | පලායයි ද |
| **මුනි** | - | භික්ෂු තෙමේ |
| **එවං** | - | මෙසේ |
| **ගාමේ** | - | ගමෙහි |
| **චරේ** | - | හැසිරෙන්නේ ය |

**භාවාර්ථය**

මී මැස්සා මලත් එහි පැහැයත් සුවඳත් නො නසා හැසිරෙමින් මල්පැණි පමණක් හැරගෙන යන්නේ යම් සේ ද එසේ ම භික්ෂු තෙමේ දයකකුලයන්ගේ ශ්‍රද්ධාවටත් භෝගයටත් හානියක් නො කොට ගමෙහි පිඬු සිඟා යන්නේ ය.

## නිදාන කථාව

රජගහ නුවර සමීපයෙහි සක්ඛර නම් නියම්ගමෙහි 'මච්ඡරිය කෝසිය' නම් සිටුවරයෙක් වාසය කළේ ය. අසූ-කෙළක් ධනය ඔහුට තිබුණ ද තද මසුරු කමින් යුතු හේ නො කා නො බී දුක සේ කල් යැවී ය. එහෙයින් මේ ධන රාශිය රකුසන් අරක් ගත් වලක් සේ කිසිවෙකුටත් ප්‍රයෝජනයක් නැති විය.

දිනක් රජුට උපස්ථානය පිණිස ගොස් එන මොහුට අතරමග දී බඩසයින් පෙළුනු පිටිසර මිනිසෙකු තිරිඟුපිටියෙන් කළ තලප හා කබලු කැවුම් (කිරිරොටි) කනු දැක කැවුම් කෑමෙහි ආශාවක් ඇති විය.

කැවුම් කන්නට ඇති ආශාව කීයේ නම් හැමදෙනා ම කැවුම් කෑමට අපේක්ෂා සහිත වෙති. එකල නිවසෙහි ඇති තල, සහල්, ගිතෙල්, හකුරු වියදම් වන්නේ ය'යි සිතා කාලය ගෙවන සිටුවරයාගේ සිරුරෙහි නහර ඉල්පින. සිරුර සුදුමැලි විය. කැවුම් කෑමේ ආශාව තවත් බලවත් විය. එහෙයින් සිටුවරයා දිනක් කාමරයට වැද ඇඳක වැතිර අතපය හකුළුවා නිදා ගත්තේ ය.

පසු ව සිටුදේවිය තොරතුරු අසා සිටුවරයාට පමණක් කැවුම් පිසීම ප්‍රමාණවත් බව සිටුවරයාගෙන් ම දැන අවශ්‍ය දේ රැගෙන සිටුවරයා කැටුව සිටු මැදුරේ උඩුමහලට ගොස් කැවුම් පිසීමට වන්නී ය.

බුදුරජාණන් වහන්සේ එදා අලුයම් වේලෙහි ලොව බලා වදාරන සේක් 'මච්ඡරිය කෝසිය' සිටාණන් හා සිටුදේවියට සෝවාන් වීමට හේතු සම්පත් ඇති බව දැක මුගලන් තෙරුන් වහන්සේ කැඳවා "මොග්ගල්ලාන, රජගහ නුවර 'මච්ඡරිය කෝසිය' සිටු තෙමේ කැවුම් කන්නෙමි'යි කියා අනුන්

දක්නා බියෙන් උඩුමහලට නැඟී බිරිය ලවා කැවුම් පිසවයි. එහි ගොස් සිටු හික්මවා ඔවුන් ලවා ම කැවුම් ගිතෙල් ආදිය ගෙන්වා ගෙන මෙහි එන්නැ" යි කියා පිටත් කළහ.

එකෙනෙහි ම තෙරුන් වහන්සේ ඍද්ධි බලයෙන් එහි ගොස් දනාදියෙහි විපාකත් තෙරුවන් ගුණත් කියා සිටු තෙමේ පහදවා එම යුවල ලවා ම කැවුම් ගිතෙල් ආදිය ගෙන්වා ගෙන සැවැත් නුවර ජේතවනාරාමයට අවුත් බුදුන් වහන්සේ ප්‍රධාන පන්සියයක් භික්ෂූන් වහන්සේට කැවුම් වළඳවා ලූහ. සිටු තෙමේත් භාර්යාව හා එක් ව බඩ පුරා කැවුම් කැයේ ය. වෙහෙරවැසි අනෙක් භික්ෂූන්ට, හිඟන්නන්ට හා පුලනන්නටත් දී ද කැවුම් අවසන් නො වීය.

එකල සිටු තෙමේ, "ස්වාමීනි, කැවුම් අවසන් වන අයුරක් නො පෙනෙන්නේ ය" යි කීය. "එසේ නම් දෙවුරම් වෙහෙර දොරටුවෙහි බහාලව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. එවිට ඔහු කැවුම් ගෙන ගොස් දොරකොටුව අසල ඉදිරියට නෙරා සිටි ගල් තලාවක් යට දැමී ය.

ඉක්බිති සිටු තෙමේ බිරින්දෑ සමඟ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් එකත්පසෙක හුන්නේ ය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඔවුන්ට අනුමෝදනා කළ සේක. බණ අවසන්හි දෙදෙනාම සෝවාන් ඵලයට පැමිණියෝ ය. එද පටන් සිටු තෙමේ ඒ අසූ-කෙළක් ධනය සසුන් දියුණුවට යෙදෙව්වේ ය.

එද දවස දම්සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් වහන්සේ මුගලන් ස්වාමීන් වහන්සේගේ මහිමය ගැන කථා කරමින් හුන්හ. එකල එහි වැඩි බුදුරජාණන් වහන්සේ "මහණෙනි, කුල පහදවන්නන් විසින් කුලයන්ගේ ශ්‍රද්ධාව නො නැසෙන සේ සම්පතට ද හානි නො කොට මල් රොන් ගන්නා මී මැස්සකු සේ කුලය කරා එළඹ බුදුගුණ දක්වෙන සේ හැසිරිය යුතු ය. මගේ පුත්‍ර වූ මොග්ගල්ලාන එවැන්නෙකි" යි තෙරුන්ට ප්‍රශංසා කොට "**යථාපි භමරෝ පුප්ඵං**" යන ගාථාව වදාළ සේක. සම්මාසම්බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව කොට තව තවත් තෙරුන් වහන්සේගේ ගුණ කියනු පිණිස "මහණෙනි, මොග්ගල්ලාන විසින් මච්ඡරිය සිටු දමනය කරන ලද්දේ අද පමණක් ම නො වේ. පෙරත් ඔහු දමනය කොට කර්මඵල සම්බන්ධය කියා දෙන ලදැ"යි වදරා ඉල්ලීස ජාතකය ද වදාළ සේක.

**ආත්මෝපදේශය** - වීමංසනයෙන් තොර වූ මිනිසා අන්ධයෙකුට සමාන ය.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(ඇසළ 2552)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පරිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**